**සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම - 2016/2017**

-----------------------------------------------------------------

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුලත් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

-----------------------------------

(අ) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට සමාගමේ ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුළු ශේෂය රු.මිලියන 2,287.09 ක්වූ අතර ඉන් සියයට 64 නියෝජනය වන රු.මිලියන 1,466.90 ක ශේෂයක් සී/ස ඇවන් ගාර්ඩ් මෙරිටයිම් සර්විස් (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතුව තිබුණි. සමාගමට ලැබීමට ඇති ණය මුදල සනාථ කිරීම සම්බන්ධ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

එසේම මූල්‍ය ප්‍රකාශන අනුව ඇවන්ගාර්ඩ් සමාගමට නිරවුල් කල යුතු රු.මිලියන 762.80 ක් වූ ණය ශේෂය සනාථ කිරීම සඳහා අවශ්‍ය ශේෂ සනාථ කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් නොවුණි.
උක්ත කරුණට අමතරව සී/ස ඇවන් ගාර්ඩ් මැරිටයිම් සර්විස් (පුද්ගලික) සමාගම විසින් සිංගප්පූරුවේ ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ පවරා තිබූ නඩුවේ තීන්දුව ලෙස වන්දි මුදල වශයෙන් ඇ.ඩො.5,000,000 ක් හා සිංගප්පූර් ඩොලර් 826,000 ක් එම සමාගමට ගෙවන ලෙස 2016 නොවැම්බර් 24 දින නියම කොට තිබුණු නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2017 මාර්තු 31 දිනට සමාගම වෙත අයවිය යුතුව පැවති ණයගැතියන්ගෙන් (Trade Receivable) රු.මිලියන 426.02 ක් හා ඇ.ඩො.8,870,783 ක්වූ ණයගැති ශේෂ අතුරින් ණයගැතියන් විසින් සනාථ කරන ලද්දේ පිළිවෙලින් රු.මිලියන 15.75 ක හා ඇ.ඩො.38,155 ක ශේෂ පමණි. ඒ අනුව ණයගැති ශේෂවල පිළිවෙලින් රු.මිලියන 410.27 ක් හා ඇ.ඩො.8,832,628 ක්වූ ණයගැති ශේෂ තහවුරු කර නොතිබුණි. තවද, ණයගැතියන්

11 දෙනකුගෙන් ලැබී තිබුණු ශේෂ සනාථ කිරීම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණු කේවල ණයගැති ශේෂ සමඟ එකඟ නොවීය. සමාගමේ කේවල ණය ගිණුම් අනුව එම ණයගැතියන්ගෙන් එකතුව රු.මිලියන 10.79 ක් සහ ඇ.ඩො.10,524 ක් ලැබිය යුතුව තිබුණු නමුත් සනාථ කරන ලද ණයගැති ශේෂයන් අනුව එම වටිනාකම රු.මිලියන 9.56 ක් පමණක් විය.

(ඈ) වෙනත් ලැබිය යුතු අගයෙහි (Other Receivable) ඇතුලත් රු.මිලියන 377 ක් වන ගාලු පාවෙන අවි ගබඩාව, රු.මිලියන 83 ක් වන ගුවනින් අවි ප්‍රවාහනය කිරීමේ ව්‍යාපෘතිය, රු.මිලියන 9 ක් වන ලැබිය යුතු සේවක ණය හා අත්තිකාරම් සහ රු.මිලියන 47.7 ක් වූ වෙනත් ලැබිය යුතු අගයට අදාල ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) 2017 මාර්තු 31 දිනට සමාගමේ ණයගැති උපලේඛනවලට අනුව ගොඩබිම් අංශයේ ණය ගැති ශේෂවල එකතුව රු.මිලියන 6.22 ක්වූ ඍණ ශේෂයන් ඇතුලත්ව තිබුණු බව නිරීක්ෂණය විය. ගොඩබිම් අංශයේ එකතුව රු.මිලියන 3.02 ක් හා සමුද්‍ර අංශයේ එකතුව රු.මිලියන 13.21 ක් වූ ණයගැති ශේෂ වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 අනුව කල්ඉකුත් වූ ණයගැති ශේෂ වෙනුවෙන් ප්‍රමාණවත් බොල් ණය වෙන්කිරීම් සිදුකළ යුතු වුවත් සමුද්‍ර මෙහෙයුම් අංශයේ මුළු ණයගැතියන්ගෙන් රු.මිලියන 1,085.57 ක් නියෝජනය වූ සියයට 79 ක් වර්ෂයක් ඉක්ම වූ ණයගැති ශේෂ වන අතර ඒ වෙනුවෙන් අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ඊ) 2017 මාර්තු 31 දිනට සමාගම සතු පාවෙන අවි ගබඩාවන්වල හා විදේශ වරායන්හි තොග සහ පොලිස් ආයුධාගාරයන්හි පැවති ආයුධ තොග භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 19, 57 වගන්තිය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු අතර ඒ සඳහා වර්තමාන සේවා පිරිවැය සේවකයින්ගේ වයස් ප්‍රමාණය, සේවකයින්ගේ ආයු අපේක්ෂණය, සේවා පිරිවැටුමට වූ බලපෑම, විශ්‍රාම වයස, වට්ටම් අනුපාතය, වැටුප් හා වර්ධන ප්‍රතිශතය වැනි උපකල්පන යොදාගත හැකිය. නමුත් සමාගම සිය සේවක ප්‍රතිලාභ ගණනයේදී ඉහත ආයුගණන ක්‍රමය යොදා නොගන්නා බව නිරීක්ෂණය විය.

(ඌ) 2016/ 2017 මූල්‍ය වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව විලම්භිත බදු වගකීම රු.මිලියන 6.29 ක් වූ අතර විගණනයේදී ගණනය කිරීම් අනුව විලම්භිත බදු වත්කම රු.මිලියන 10.33 ක් විය. ඒ අනුව වර්ෂයේ ලාභය සහ වගකීම් රු.මිලියන 16.62 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාගමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 739.46 ක පිරිවැයක් දරා තිබුණු නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණු බවත් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම්කර තිබූ ඉඩමෙහි අයිතිය සමාගම වෙත පවරාගෙන නොතිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඒ) 2017 මාර්තු 31 දිනට නිල ඇඳුම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයත් එදිනට සිදුකරන ලද භෞතික තොග ගණනය අනුව අගයත් අතර රු.මිලියන 1.29 ක වෙනසක් නිරූපණය විය.

(ඔ) 2017 මාර්තු 31 දිනට පවතින පතරොම් තොගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමේදී පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට දැක්විය යුතු වුවත්, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය ව්‍යාවනය

------------------

මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය,

- මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වන ලද කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන නොමැති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත | |
| i. ප්‍රමිත අංක 39 – 46(බී) ඡේදය | පරිණත වන කාලය එළඹෙන තෙක් රඳවාගෙන ඇති ආයෝජන හා මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය අගයට ගණනය කළ යුතු වුවත් සමාගමේ රු.මිලියන 698.01ක් වටිනා ස්ථාවර තැන්පතුවල මුහුණත් අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. |

| | |
|---|---|
| ii. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 – 14 ඡේදය | ඇප සඳහා තබා ඇති මූල්‍ය වත්කම්වල වටිනාකම සහ එම ඇප පිළිබඳ නියම හා කොන්දේසි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, සමාගම විසින් ආරක්ෂක සේවාවන් ලබාදීම වෙනුවෙන් ඇප වශයෙන් රඳවා තබාගෙන තිබුණු රු.මිලියන 216.79 ක් වූ ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | |
| i. 61(b)(ii) වගන්තිය | ලාභාංශ බදු වගකීම් ගණනය කිරීම පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. |
| ii. 113 වගන්ති | ආදායම් බදු සඳහා ස්වතක්සේරු ආදායම් බදු ගෙවීම් නියමිත දින හෝ ඊට පෙර කළ යුතු වුවත් 2016/2017 තක්සේරු වර්ෂය සඳහා කිසිදු ස්වතක්සේරු බදු ගෙවීමක් සිදුකර නොතිබුණි. |
| (ඇ) 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ 5 වන වගන්තිය | සේවකයෙකු විශ්‍රාම ගිය දින සිට මසක් ඇතුලත පාරිතෝෂික ගෙවීම් සිදුකල යුතු වුවත්, විගණන නියැදි පරික්ෂණයකදී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණු රු.මිලියන 1.82 පාරිතෝෂික ගෙවීම් පැවති බව නිරීක්ෂණය විය. |

**2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පතුවලින් ලැබුණු පොලී ආදායම්වලින් රු.මිලියන12.44 ක මුදලක් වෙනම ලෙජර් ගිණුමකට බැර කර තිබුණු අතර ඒ වෙනුවෙන් පවත්වා තිබුණු බැංකු ගිණුමේ 2017 මාර්තු 31 දිනට රු.මිලියන 23.81 ක ශේෂයන් පැවති බව බැංකු විසින් තහවුරු කර තිබුණි. එම බැංකු ගිණුම පවත්වාගෙනයාමේ අරමුණ පැහැදිලි කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-------------------------

**මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 48.61 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 356.67ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 308.06 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීම සඳහා පහත සඳහන් කරුණු ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

| විස්තරය | ගිණුම් වර්ෂය<br>2016/ 2017 | 2015/ 2016 | ආදායම/ වියදම (වැඩිවීම/ අඩුවීම) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| **ආදායම** | | | | |
| ගොඩබිම් මෙහෙයුම් අංශය | 637.67 | 996.58 | (358.91) | 36 |
| සමුද්‍ර මෙහෙයුම් අංශය | 285.20 | 807.66 | (522.46) | 65 |
| **වියදම්** | | | | |
| පුහුණු දීමනා ගොඩබිම් අංශය | 8.85 | - | 8.85 | - |
| පරිත්‍යාග කිරීම් | 1.25 | 0.72 | 0.53 | 74 |
| පුහුණු පාසලේ වියදම (ශුද්ධ) | 2.51 | 2.29 | 0.22 | 9 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

කල්බදු වගකීම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.මිලියන 1.29 ක වටිනාකම තහවුරු කරගැනීම සඳහා බැංකුවෙන් ණය ශේෂ සනාථ කෙරෙන ලිපියක් ලැබී නොතිබුණි.

### 4.1 විග්‍රහාත්මක සමාලෝචනය

| | ගිණුම් වර්ෂය<br>2016/ 2017 | 2015/ 2016 | වැඩිවීම/ (අඩුවීම)<br>% |
|---|---|---|---|
| (අ) දළ ලාභ අනුපාතය | 11.42% | 29.01% | (17.59) |
| (ආ) ශුද්ධ ලාභ අනුපාතය | 6.75% | 26.45% | (19.7) |
| (ඇ) කොටසක ඉපයුම් අනුපාතය | 463 | 823 | (44) |

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාගමේ දළ ලාභ අනුපාතය, ශුද්ධ ලාභ අනුපාතය, කොටසක ඉපයුම් අනුපාතය පිළිවෙලින් සියයට 18, සියයට 20 හා සියයට 44 කින් අඩුවී තිබුණි.

### 4.2 නොසැසඳුනු පාලන ගිණුම්

ගෙවිය යුතු තැන්පතු ශේෂයෙහි ඇතුලත් වූ පාරිභෝගික තැන්පතු සම්බන්ධයෙන් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛනයේ රු.මිලියන 124.84 ක වටිනාකමක් නිරූපණය වූ නමුත් මූල්‍ය

ප්‍රකාශනවල දක්වා තිබුණේ රු.මිලියන 96.14 ක ශේෂයක් පමණි. ඒ අනුව, එම ශේෂ අතර රු.මිලියන 28.70ක වෙන සක් නිරූපණය වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් 2016/2017 මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන දින 370 (වර්ෂ 01 දින 05) ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්
-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
ආ) ණයගැතියෝ හා ණයහිමියෝ
ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත
ඈ) තොග සත්‍යාපනය
ඉ) බද්දුකරණය
ඊ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම